## ලයනල් ගුරුගේ එ. ආරක්ෂක අමාත්‍යාංශය

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/ 1556 /2019 (2019.09.24 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - ලයනල් ගුරුගේ
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරී, ආරක්ෂක ලේකම් කාර්යාලය

**පෙනීසිටීම**

අභියාචක - ලයනල් ගුරුගේ
පොදු අධිකාරිය - එල්.එන්.පී. පෙරේරා, නීති නිලධාරී
පී.ඩී.කේ.ටී. ජයසිංහ, අධ්‍යක්ෂ පරිපාලන, ශ්‍රී ලංකා ගුවන් හමුදාව
එච්.පී.කේ.පී.ටී. දහනායක, නීති නිලධාරී, ශ්‍රී ලංකා ගුවන් හමුදාව
අනිල් ධනසූරිය, නීති නිලධාරී, ආරක්ෂක අමාත්‍යාංශය
ටී.ඒ.බී. අරම්පත්, නීති නිලධාරී

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2019.06.10 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2019.06.17, 2019.06.21, 2019.07.02, 2019.07.06, 2019.07.15 |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2019.07.08 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | 2019.07.11, 2019.07.17, 2019.08.16 |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019.08.22 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2019.06.10 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා සිටින ලදි.

*2018 වර්ෂයේ ජුනි මස 01 වනදින දක්වා පහත දැක්වෙන ත්‍රිවිධ හමුදාවන්හි ඒ ඒ නිලයේ දැනට සේවය කරන කාන්තා නිලධාරීනියන්ගේ හා පිරිමි නිලධාරීන්ගේ සංඛ්‍යාව.*

*I. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ*
*ජෙනරාල්, ලුතිනන් ජනරාල්, මේජර් ජනරාල්, බ්‍රිගේඩියර්, කර්නල්, ලුතිනන් කර්නල්, මේජර්, කැප්ටන් හා ලුතිනන් යන නිලයන්*

*II. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ*
*එයාර් චීෆ් මාර්ෂල්, එයාර් මාර්ෂල්, එයාර් වයිස් මාර්ෂල්, එයාර් කොමඩෝර්, ගෲප් කැප්ටන්, විංග් කමාන්ඩර්, ස්කොඩ් රන් ලීඩර්, ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් හා පියාසර නිලධාරී යන නිලයන්*

*III. ශ්‍රී ලංකා නාවික හමුදාවේ*
*අද්මිරාල්, වයිස් අද්මිරාල්, රියර් අද්මිරාල්, කොමඩෝර්, කැප්ටන්, කමාන්ඩර්, ලුතිනන් කමාන්ඩර්, ලුතිනන් හා උප ලුතිනන් යන නිලයන්*

ආරක්ෂක අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරියා විසින් තොරතුරු ඉල්ලීම ත්‍රිවිධ හමුදාවන්හි තොරතුරු නිලධාරීන්ට යොමුකළ බව 2019.06.17 දින අභියාචකට දන්වන ලද අතර ශ්‍රී ලංකා නාවික හමුදාවේ තොරතුරු නිලධාරිය විසින් 2019.07.15 දිනැතිව අදාළ තොරතුරු අභියාචක වෙත ලබා දෙන ලදි. 2019.06.21 දිනැතිව ශ්‍රී ලංකා ගුවන් හමුදාව ප්‍රතිචාර දක්වන ලද්දේ ඉල්ලා ඇති තොරතුරු ලබාදීම ජාතික ආරක්ෂාවට තර්ජනයක් වියහැකි බවට පෙනීයන බැවින් ලබා දිය නොහැකි බවයි. 2019.07.06 දිනැතිව ශ්‍රී ලංකා යුද හමුදාව විසින් පනතේ 5(1)(ආ)(i) මත පදනම්ව තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කරන ලදි. මෙම ප්‍රතිචාරයන්ගෙන් අතෘප්තියට පත් අභියාචක 2019.07.08 දිනැතිව ආරක්ෂක අමාත්‍යාංශයේ නම්කළ නිලධාරියාට අභියාචනයක් යොමුකළ අතර 2019.07.11 දිනැතිව ආරක්ෂක අමාත්‍යාංශයේ නම්කළ නිලධාරියා අදාළ අභියාචනය ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හා ශ්‍රී ලංකා යුද හමුදාවේ නම්කළ නිලධාරීන්ට යොමුකරන ලදි. 2019.07.17 දිනැතිව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නම්කළ නිලධාරියා විසින් පනතේ 5(1)(ආ)(i) හා 5(1)(2) වගන්ති ප්‍රකාරව තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කරන ලදි. 2019.08.16 දිනැතිව ශ්‍රී ලංකා යුද හමුදාවේ නම්කළ නිලධාරියා විසින් පනතේ 5(1)(ඌ)(2) හා 5(1)(ආ)(i) වගන්ති ප්‍රකාරව තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කරන ලදි. මෙම ප්‍රතිචාරයන්ගෙන්ද අතෘප්තියට පත් අභියාචක 2019.08.22 දිනැතිව කොමිෂන් සභාවට අභියාචනයක් යොමුකරන ලදි.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

අභියාචනා විභාගය සඳහා දෙපාර්ශ්වයම පැමිණ ඇතිබව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

අභියාචක විසින් කරුණු දක්වා සිටින ලද්දේ අදාළ තොරතුරු මේ වනවිට ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ලබාදී ඇති මුත් ශ්‍රී ලංකා ගුවන් හමුදාව හා ශ්‍රී ලංකා යුද හමුදාව විසින් ලබාදීම ප්‍රතික්ෂේප කර ඇති බවයි.

මෙහිදී ශ්‍රී ලංකා ගුවන් හමුදාව හා ශ්‍රී ලංකා යුද හමුදාව නියෝජනය කරමින් පැමිණ සිටින් නිලධාරීන් කරුණු දක්වා සිටියේ අදාළ තොරතුරු හෙළිදරව් කිරීම ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකිය යන පදනම මත පනතේ 5(1)(ආ)(1) ප්‍රකාරව ප්‍රතික්ෂේප කළ බවයි.

මෙම කරුණු දැක්වීම මත කොමිෂන් සභාව පොදු අධිකාරියට අවධාරණය කර සිටියේ පනතේ 5(1)(ආ)(1) වගන්තිය එනම් ජාතික ආරක්ෂාව පිළිබඳ ව්‍යතිරේකයේ රක්ෂණය පොදු අධිකාරිය විසින් ලබා ගැනීමට නම් තොරතුරු ලබා දීමෙන් ජාතික ආරක්ෂාවට වන තර්ජනය පැහැදිලිවම පෙන්වා දිය යුතු බවයි.

මීට ප්‍රතිචාර ලෙස පොදු අධිකාරීන් විසින් සඳහන් කර සිටියේ අදාළ තොරතුරු ලබාදීම මඟින් හමුදාවන්හි ශක්නුතාවන්/ශක්තීන් (strength of forces) පිළිබඳව අනාවරණය වීමක් සිදුවන නිසා එම තොරතුරු ලබාදීම සිදුකළ නොහැකි බවයි. එසේම ලෝකයේ කිසිදු රටක් තම හමුදාවන්හි තොරතුරු බැහැර කිරීමේ පරිචයක් නොපවතින බවත් එසේ තොරතුරු හෙළිදරව් කිරීමෙන් එය ඍජුවම හමුදාවන්හි ශක්නුතාවන්/ශක්තීන් (strength of forces) හෙළිදරව් වීමක් සිදුවන බැවින් එය ජාතික ආරක්ෂාවට ඍජුවම තර්ජනයක් විය හැකි බවයි. මෙහිදී නාවික හමුදාව විසින් අදාළ තොරතුරු හෙළිදරව් කිරීම වුවද, ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැකි බව පෙන්වා දුන් ශ්‍රී ලංකා යුද හමුදාව හා ශ්‍රී ලංකා ගුවන් හමුදාව එම ක්‍රියාව සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සිදුකරන බවද දක්වා සිටින ලදි.

මෙහිදී අභියාචක විසින් තවදුරටත් කරුණු දක්වා සිටියේ 2018.06.22 දිනැතිව ආරක්ෂක අමාත්‍යාංශය විසින් ත්‍රිවිධ හමුදාවන්හි ඉහළ නිලයන්ගේ සිට පහළ නිලයන් පහක් දක්වා කාන්තා නිලධාරීන්ගේ සංඛ්‍යාත්මක දත්ත ලබා දී ඇති බවත් එසේම ශ්‍රී ලංකා නාවික හමුදාව අදාළ තොරතුරු ලබාදීම මත ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් එකිනෙකට පරස්පර මිනුම්දඬු ශ්‍රී ලංකා යුද හමුදාව හා ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් අනුගමනය කරන්නේ දැයි විමසා සිටින ලදි.

මෙම කරුණු දැක්වීම් මත කොමිෂන් සභාව නිරීක්ෂණය කර සිටිනුයේ අදාළ තොරතුරු සංඛ්‍යාත්මක ලෙස නොව හුදෙක් ප්‍රතිශත ලෙස හෝ ලබාදීම හරහා ජාතික ආරක්ෂාව විෂයෙහි තර්ජනයක් නොවන බවයි.

නමුත් පොදු අධිකාරීන් සඳහන් කර සිටියේ මීට පෙරාතුව ආරක්ෂක අමාත්‍යාංශයෙන් කාන්තා නිලධාරිනියන්ගේ සංඛ්‍යාත්මක දත්ත ලබාදී ඇති හෙයින් යම් හෙයකින් ප්‍රතිශත ලෙස අදාළ තොරතුරු ලබා දීමෙන් එය සංඛ්‍යාත්මකව ගණනය කළ හැකි බැවින්, ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය හැක්කේ එමඟින්ද හමුදාවන්හි ශක්නුතාවන්/ශක්තීන් (strength of forces) පිළිබඳව අනාවරණය වීමක් සිදුකළ හැකි බවට වන මතයේ පිහිටාය. එසේම යම් හෙයකින් මෙම තොරතුරු ලබා දුනහොත් අනාගතයේදී සෑම කරුණක් පිළිබඳව හමුදාවන්ගෙන් තොරතුරු ඉල්ලා සිටීමේ පරිචයක් නිර්මාණය විය හැකි බවයි.

නමුත් මෙහිදී කොමිෂන් සභාව විසින් අවධාරණය කර සිටිනුයේ මෙම සිදුවීමට පමණක් සීමාවන පරිදි එනම් නිලධාරීන්ගේ සංඛ්‍යාත්මක දත්ත පමණක් ප්‍රතිශත ලෙස අදාළ තොරතුරු ලබාදීමෙන් අනාගතයේදී හමුදාවන් සම්බන්ධව ඉදිරිපත්වන තොරතුරු සම්බන්ධ අභියාචනයන්ට මෙම තීරණය අනුගම්‍යවීමක් සිදු නොවන බවයි. එසේම ඒ ඒ හමුදාවන්හි අදාළ තොරතුරු සැපයීම වැලැක්වීම සම්බන්ධව යම්කිසි රෙගුලාසියක් හෝ නීතියක් පවතී නම් ඒ පිළිබඳව සඳහන් කිරීම අවශ්‍ය වන බවද කොමිෂන් සභාව අවධාරණය කර සිටී.

නියෝගය

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් මීට අදාළ තොරතුරු මේ වන විටත් නිකුත් කර ඇති ඇති බව නිරීක්ෂණය වේ.

අභියාචක විසින් සිදුකරනු ලබන අධ්‍යයනයට අයත් රටවල මෙකී තොරතුරු හෙළිදරව් කිරීම මෙන්ම කලාපයේ අනෙක් රටවල මේ හා සම්බන්ධ සාමාන්‍ය තත්වය පිළිබඳ සන්සන්ධනාත්මක කරුණු දැක්වීමක් මීළඟ අභියාචනා විභාගයට පෙර පොදු අධිකාරීන්ට පිටපත් සහිතව කොමිෂන් සභාවට යොමුකළ යුතු බවට අභියාචක වෙත නියෝග කරනු ලැබේ.

එසේම ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සමස්ථ ශක්නුතාව රහසිගත තොරතුරු ලෙස වර්ගීකරණය කර ඇත්තේ කවර නීතියක් හෝ චක්‍රලේඛයක් යටතේද සහ එවැනි තොරතුරුවල ප්‍රතිශතයන් නිකුත් කළ හැකිද නොහැකිද යන්න අඩංගු පොදු අධිකාරියේ ස්ථාවරය පිළිබඳ ලිඛිත කරුණු දැක්වීමක් අභියාචකටද පිටපත් සහිතව කොමිෂන් සභාවට යොමුකළ යුතු බවට පොදු අධිකාරිය වෙත මින් නියෝග කරනු ලැබේ.

එසේම දෙපාර්ශවයන්ගේ මෙකී ලිඛිත කරුණු දැක්වීම් මීළඟ අභියාචනා විභාග දිනයට සති දෙකකට පෙර කොමිෂන් සභාවට යොමුකළ යුතුය.

ඒ අනුව මීළඟ අභියාචනා විභාගය 2019.12.17 පෙ.ව. 10.00ට කල්තබනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03)  ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.
******